# ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
# தேசிய நூதனசாலை திணைக்களம்
# Department of National Museums











## වාර්ෂික කාර්ය සාධන වාර්තාව
## வருடாந்த செயலாற்றுகை அறிக்கை
## Annual Performance Report

# 2013

# ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය

# ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
# කාර්ය සාධන වාර්තාව - 2013




ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
කොළඹ - 07

# ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය

# ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව
# කාර්ය සාධන වාර්තාව - 2013

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

කොළඹ - 07

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ | - | 011- 2695366 |
| ෆැක්ස් අංකය | - | 011- 2692092 |
| පොදු දුරකථන අංකය | - | 011- 2694767 |
| ඊමේල් ලිපිනය | - | nmdep@slt.lk |
| වෙබ් ලිපිනය | - | www.museum.gov.lk |

# ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර

## <u>දැක්ම</u>

සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා ජාතික උරුමය සංරක්ෂණය, ප්‍රවර්ධනය සහ ප්‍රචාරණය කිරීම

## <u>මෙහෙවර</u>

සංස්කෘතික හා ස්වභාවික උරුමයට අයත් සම්පත් විද්‍යාත්මකව හා ක්‍රමානුකූලව ආරක්‍ෂා කිරීම හා මහජනතාවගේ ඇගයීම , අධ්‍යාපනය සහ රසාස්වාදය උදෙසා ඉදිරිපත් කිරීම.

| පටුන | පිටු අංකය |
|---|---|
| • ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර | |
| • හැඳින්වීම | 01 |
| 1. මූල්‍ය ප්‍රතිපාදන | 02 |
| 2. පාලන අංශය | 03 - 05 |
| 3. 2013 වර්ෂයේ දෙපාර්තමේන්තුවට මිළ දී ගත් භාණ්ඩ | 05 |
| 4.කෞතුකාගාර නරඹන්නන් පිළිබඳ විස්තර | 06 |
| 5. විවිධ අංශ | 06 - 12 |
| 5:1 සංස්කෘතික අංශය | |
| 5:1:1 මානව වංශ විද්‍යා අංශය | |
| 5:1:1 මානව විද්‍යා අංශය | |
| 5:2 විද්‍යාත්මක අංශය | 12- 20 |
| 5:2:1 උද්භිද විද්‍යා අංශය | |
| 5:2:2 කීට විද්‍යා අංශය | |
| 5:2:3 භූවිද්‍යා අංශය | |
| 5:2:4 සත්ත්ව විද්‍යා අංශය | |
| 6. අධ්‍යාපන අංශය | 21 - 22 |
| 7. ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරය | 23 |
| 8. ජාතික කෞතුකාගාර පුස්තකාලය | 23 - 24 |
| 9. ඡායාරූප අංශය | 24 |
| 10. සංරක්ෂණ අංශය | 24 - 29 |
| 11. මෝස්තර සම්පාදක අංශය | 29 |
| 12. ප්‍රලේඛන අංශය | 30 |
| 13. ප්‍රාදේශිය කෞතුකාගාර | 30 - 38 |
| 13:1 කොළඹ ජාතික කෞතුකාගාරය | |
| 13:2 ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය | |
| 13:3 ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය | |
| 13:4 මහනුවර ජාතික කෞතුකාගාරය | |
| 13:5 ඕලන්ද කෞතුකාගාරය කෞතුකාගාරය | |
| 13:6 රත්නපුර ජාතික කෞතුකාගාරය | |
| 13:7 අනුරාධපුර ජන කෞතුකාගාරය | |
| 13:8 ගාල්ල ජාතික කෞතුකාගාරය | |
| • 2013 වර්ෂයේ ආදායම | 39 - 40 |
| • ඇමුණුම අංක 01 | 41 - 45 |

## 2013 වර්ෂය සඳහා ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂකගේ කාර්යය සාධන වාර්තාව.

### හැඳින්වීම

අංග සම්පූර්ණ කෞතුකාගාර සේවාවක් රටට ලබාදීම ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේය. මෙම අරමුණ මුදුන්පත් කර ගැනීම සඳහා ක්‍රියාකිරීමේදී සාමාන්‍ය වශයෙන් කෞතුකාගාරයක් හා සම්බන්ධ නානාවිධ කාර්ය පථයන් අතරින් අප රටට වඩාත් උචිත වන්නා වු කාර්ය පථයන් තෝරා ගැනීමට දෙපාර්තමේන්තුවට සිදුවේ. මෙම තෝරා ගැනීමට අදාළ වන ප්‍රතිපත්ති සම්පාදනයෙහිලා දෙපාර්තමේන්තුවේ ප්‍රයෝජනය පිණිස ලබාගත හැකි විවිධ සම්පත් මෙන්ම රටේ අවශ්‍යතාවයද සැලකීමට භාජනය කරනු ලැබේ. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම ප්‍රතිපත්ති ප්‍රධාන කොටම ක්‍රියාත්මක කරනු ලබන්නේ, සමස්තයක් වශයෙන් මුළු රටම නියෝජනය කෙරෙන රැස්කිරීම් සම්භාරයකින් සමන්විත වු කොළඹ ජාතික කෞතුකාගාරය මගිනි. මීට අමතරව කොළඹ ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය, මහනුවර ජාතික කෞතුකාගාරය, රත්නපුර ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික කෞතුකාගාරය, ගාල්ල ජාතික සමුද්‍ර කෞතුකාගාරය, පිටකොටුවේ ඕලන්ද කෞතුකාගාරය, අනුරාධපුර ජන කෞතුකාගාරය හා නිදහස් අනුස්මරණ කෞතුකාගාරය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන අතර, එම ප්‍රදේශවලට ආවේණික සංස්කෘතික සහ ස්වභාවික විද්‍යා උරුමයන් ද විදහා දැක්වීම එකී කෞතුකාගාරවල කාර්ය භාරය වේ. එපමණක්ද නොව දිස්ත්‍රික් පදනමක් මත ආරම්භ කරන ලද පාසැල් විද්‍යා කෞතුකාගාර යෝජනා ක්‍රමය සහ ජංගම කෞතුකාගාර සේවයද හේතුකොට ගෙන දෙපාර්තමේන්තුවේ සේවා පථය පුළුල් වී තිබේ. මේ අනුව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව සතු කාර්යයන් පහත දැක්වෙන පරිදි විශ්ලේෂණය කර දැක්විය හැකිය.

I. ප්‍රාග් ඉතිහාසය, මානවවංශ විද්‍යාව, මානව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, කීට විද්‍යාව, භූගර්භ විද්‍යාව හා පාෂාණධාතු විද්‍යාව යන විවිධ ක්ෂේත්‍රයන්ට අදාළවන්නා වු වස්තූන් සහ ආදර්ශ රැස්කිරීම, ලේඛනාරූඪ කිරීම සහ ආරක්ෂා කිරීම.

II. යථෝක්ත ක්ෂේත්‍රයන්හි පර්යේෂණ පැවැත්වීම.

III. විද්වතුන්ගේ මෙන්ම ආධුනිකයන්ගේ ද ප්‍රයෝජනය පිණිස, ස්පෝලියා සෙලනිකා, නමැති පර්යේෂණ සංග්‍රහය සහ වෙනත් සඟරා සහ ඒක විෂයක සංග්‍රහයන් ප්‍රකාශයට පත් කිරීම.

IV. රටේ ඉතිහාසය, කලා ශිල්ප හා ස්වාභාවික විද්‍යාවන්ටද අදාළ වන්නා වු දැනීම ප්‍රචලිත කිරීම වස් දේශන, ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ ආදියෙන් සමන්විත අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

# (1). මූල්‍ය ප්‍රතිපාදන.

**වෙන්කළ ප්‍රතිපාදන, මූල්‍ය වියදම හා මූල්‍ය ප්‍රගතිය.**

2013 වර්ෂයේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව සඳහා වෙන්කළ ප්‍රතිපාදන, මූල්‍ය වියදම හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

| 2013 ප්‍රතිපාදන | ප්‍රතිපාදන | වියදම | මූල්‍ය ප්‍රගතිය. |
|---|---|---|---|
| **පුනරාවර්තන ප්‍රතිපාදන** | රු. 112,770,000.00 | රු. 105,922,665.00 | 94% |
| **මූලධන ප්‍රතිපාදන** | රු. 92,400,000.00 | රු. 45,295,522.00 | 49% |
| එකතුව | රු. 205,170,000.00 | රු. 151,218,187.00 | 74% |

| පුනරාවර්තන වියදම | වෙන් කළ ප්‍රතිපාදන | මූල්‍ය වියදම | මූල්‍ය ප්‍රගතිය. |
|---|---|---|---|
| 1. සාමාන්‍ය පරිපාලනය | රු.17,445,000.00 | රු. 15,351,938.00 | 88% |
| 2. කෞතුකාගාර අධ්‍යාපනය | රු. 29,997,000.00 | රු. 27,644,618.00 | 92% |
| 3. කෞතුකාගාර සේවා | රු. 65,328,000.00 | රු. 62,926,099.00 | 96% |
| එකතුව | රු.112,770,000.00 | රු. 105,922,655.00 | 94% |

| මූලධන වියදම | වෙන් කළ ප්‍රතිපාදන | මූල්‍ය වියදම | මූල්‍ය ප්‍රගතිය. |
|---|---|---|---|
| 1. සාමාන්‍ය පරිපාලනය | රු. 3,100,000.00 | රු. 1,037,947.00 | 33% |
| 2. කෞතුකාගාර අධ්‍යාපනය | රු. 4,000,000.00 | රු. 1,164,042.00 | 29% |
| 3. කෞතුකාගාර සේවා | රු. 85,300,000.00 | රු. 43,093,533.00 | 51% |
| එකතුව | රු. 92,400,000.00 | රු. 45,295,522.00 | 72% |

## (2). සාමාන්‍ය කටයුතු

2013 වසර සඳහා අනුමත තනතුරු සංඛ්‍යාව 334 කි.

| තනතුර | සේවය | ශ්‍රේණිය / පන්තිය | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සිටින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 1 | 1 | 1 | - |
| අතිරේක අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 1 | 2 | - | 2 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 11/111 | 1 | 1 | - |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | 11/1, 11/11 | 6 | 4 | 2 |
| ගණකාධිකාරී/ සහකාර අධ්‍යක්ෂ මුදල් | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 1/ 11/ 111 | 1 | 1 | - |
| පරිපාලන නිලධාරී | රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය | අධිපන්තිය | 1 | 1 | - |
| පුස්තකාලයාධිපති | ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය | අධිපන්තිය | 1 | 0 | 1 |
| භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය | - | 1 | 0 | 1 |
| කෞතුකාගාර අධිකාරී | දෙපාර්තමේන්තු ගත සේවා | - | 7 | 5 | 2 |
| සම්ප්‍රදායික කලා සහකාර | දෙපාර්තමේන්තු ගත සේවා | - | 1 | 1 | - |
| අධ්‍යාපන ප්‍රකාශන සහකාර | දෙපාර්තමේන්තු ගත සේවා | - | 1 | - | 1 |
| ප්‍රදර්ශන සැලසුම් නිලධාරී | දෙපාර්තමේන්තු ගත සේවා | - | 1 | - | 1 |
| අයවැය සහකාර | ආශ්‍රිත නිලධාරී | - | 1 | 1 | - |
| සංරක්ෂණ නිලධාරී | ආශ්‍රිත නිලධාරී | - | 3 | 2 | 1 |
| මිලදී ගැනීම් නිලධාරී | ආශ්‍රිත නිලධාරී | - | 1 | 1 | - |
| පර්යේෂණ සහකාර | ආශ්‍රිත නිලධාරී | - | 12 | 10 | 2 |
| අධ්‍යාපන ප්‍රවර්ධන නිලධාරී | ආශ්‍රිත නිලධාරී | - | 22 | 18 | 4 |
| තොරතුරු තාක්ෂණ සහකාර | ආශ්‍රිත නිලධාරී | - | 2 | 1 | 1 |
| වැඩසටහන් සහකාර | ආශ්‍රිත නිලධාරී | - | 1 | 1 | - |
| සංවර්ධන සහකාර | ආශ්‍රිත නිලධාරී | - | 2 | 2 | - |
| සංවර්ධන නිලධාරී | ආශ්‍රිත නිලධාරී | - | 8 | 7 | 1 |
| සංවර්ධන නිලධාරී (දෙමළ) | ආශ්‍රිත නිලධාරී | - | 7 | - | 7 |

| | | | | | |
|---|---|---|---|---|---|
| කෞතුකාගාර ආරක්ෂක | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | - | 7 | 4 | 3 |
| කීටවිද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | - | 2 | - | 2 |
| උද්භිද විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | - | 1 | - | 1 |
| භූ විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | - | 1 | 1 | - |
| මානව විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | - | 1 | 1 | - |
| සත්ත්ව විද්‍යා සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | - | 1 | - | 1 |
| සංරක්ෂණ සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | - | 1 | 1 | - |
| කාර්මික නිලධාරී | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | - | 2 | - | 2 |
| පුස්තකාලයාධිපති | රජයේ පුස්තකාලයාධිපති සේවය | 1 /11/111/1V | 4 | 2 | 2 |
| ඡායාරූප ශිල්පී | දෙපාර්තමේන්තු ගත සේවා | - | 1 | 1 | - |
| රාජ්‍ය කලමණාකරණ සහකාර | රාජ්‍ය කලමණාකරණ සේවය | 1/ 11 /111 | 16 | 8 | 8 |
| චර්ම ශිල්පී | දෙපාර්තමේන්තු ගත සේවා | - | 1 | 1 | - |
| පිළිගැනීමේ නිලධාරී | දෙපාර්තමේන්තු ගත සේවා | - | 3 | 0 | 3 |
| ආදර්ශ රූප කලාකරු | දෙපාර්තමේන්තු ගත සේවා | - | 3 | 2 | 1 |
| ආරක්ෂක සහකාර | | - | 16 | 8 | 8 |
| රියදුරු | රියදුරු සේවය | - | 4 | 3 | 1 |
| ලේඛන ප්‍රතිසංස්කාරක | දෙපාර්තමේන්තු ගත සේවා | - | 9 | 7 | 2 |
| උද්‍යාන පාලක | දෙපාර්තමේන්තු ගත සේවා | - | 1 | - | 1 |
| විදුලි කාර්මික | දෙපාර්තමේන්තු ගත සේවා | - | 1 | 1 | - |
| වඩු කාර්මික | දෙපාර්තමේන්තු ගත සේවා | - | 2 | 1 | 1 |
| පින්තාරුකරු | දෙපාර්තමේන්තු ගත සේවා | - | 1 | - | 1 |
| පෙදරේරු | දෙපාර්තමේන්තු ගත සේවා | | 1 | - | 1 |
| ශ්‍රව්‍ය දෘශ්‍ය සහායක | දෙපාර්තමේන්තු ගත සේවා | - | 1 | 1 | - |
| මුර පරීක්ෂක | දෙපාර්තමේන්තු ගත සේවා | - | 1 | 1 | - |
| සහකාර මුර පරීක්ෂක | දෙපාර්තමේන්තු ගත සේවා | - | 1 | 0 | 1 |
| කෞතුකාගාර මුරකරු | දෙපාර්තමේන්තු ගත සේවා | - | 40 | 38 | 2 |
| පුස්තකාල සහායක | දෙපාර්තමේන්තු ගත සේවා | - | 2 | 2 | - |
| කෞතුකාගාර සහායක | දෙපාර්තමේන්තු ගත සේවා | - | 141 | 137 | 4 |

(අ) 2013/10/09 වන දින එස්.ටී.කස්තුරිආරච්චි මහත්මිය ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ (වැ.බ)

තනතුරට පත්විය.

(ආ) 2013 වසරේ මැදිරිභාරකරුවන් දෙදෙනෙක්, උද්භිද විද්‍යා සහකාර, වඩු කාර්මික හා කාර්යාල කාර්ය සහයක විශ්‍රාම ලබා ඇත. පාලන නිලධාරීන් දෙදෙනෙක් ස්ථාන මාරුවීම් ලබා පැමිණ ඇත. සහකාර අධ්‍යක්ෂ පාලන හා පරිපාලන නිලධාරී 2013 වසරේ ස්ථාන මාරුවීම් ලබා ගොස් ඇත. සංවර්ධන නිලධාරී තනතුරු 15 ක්, ප්‍රධාන ආරක්ෂක නිලධාරී, ආරක්ෂක සහකාර තනතුරු 03 ක් හා භාෂා පරිවර්තක තනතුරක් මෙම වසරේ අළුතින් ඇතිකරන ලදී. 2013 වසරේ සංරක්ෂණ සහකාර, රාජ්‍ය කළමණාකාර සහකාර තනතුරු 02 ක් හා සහකාර ආරක්ෂක යන තනතුරු උසස්වීම් ලබා ඇත.2013 වසරේ කෞතුකාගාර සහයක පත්වීම් 05 ක් හා සංවර්ධන නිලධාරී පත්වීම් 08 ක් නව පත්වීම් ලෙස ලබා දී ඇති මෙම වසරේ කෞතුකාගාර සහයක වරයෙක් ධූරය හැර ගොස් ඇති කෞතුකාගාර සහයක වරයෙක් හා කෞතුකාගාර මුරකරුවෙක් ඉල්ලා අස් වී ඇති 2013 වසරේදී විදේශ ගමන් සඳහා නිලධාරීන් හයදෙනෙකු සහභාග වී ඇත.

## (3) 2013 වර්ෂයේ කෞතුකාගාර දෙපාර්තමේන්තුවට මිලදී ගත් භාණ්ඩ

| භාණ්ඩය | මිළ |
|---|---|
| 1 කාර්යාලීය උපකරණ | රු. 668540.50 |
| 2 විදුලි උපකරණ | රු. 492929.00 |
| 3 පරිගණක හා අදාල උපාංග | රු.1004472.00 |
| 4 ප්‍රදර්ශක සඳහා ආකෘති /ආදර්ශක | රු.1305000.00 |
| 5 ගොඩනැගිලි අළුත්වැඩියාවට අවශ්‍ය අමුද්‍රව්‍ය | රු.2412639.00 |
| 6 අංශවලට අවශ්‍ය භාණ්ඩ හා උපකරණ | රු. 176597.00 |
| 7 ගොඩනැගිලි වලට අදාල උපකරණ | රු. 45185.00 |
| මුළු වියදම | රු.6105362.50 |

# 04 කෞතුකාගාර නරඹන්නන් පිළිබඳ විස්තර

2013 වර්ෂයේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන කෞතුකාගාර නැරඹීම සඳහා පැමිණි නරඹන්නන්ගේ සංඛ්‍යාව පහත පරිදි වේ.

| කෞතුකාගාරයේ නම | දේශිය | | විදේශිය | | පාසැල් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩිහිටි | ළමා | වැඩිහිටි | ළමා | ගුරුවරු | ළමයි | නොමිලේ | සංස්කෘතික ත්‍රිකෝණ ප්‍රවේශපත්‍ර | එකතුව |
| කොළඹ ජාතික කෞතුකාගාරය | 70699 | 19979 | 31226 | 1166 | 9060 | 92782 | 5506 | - | 230418 |
| ජාතික ස්වභාවිකවිද්‍යා කෞතුකාගාරය | 19415 | 7250 | 1220 | 80 | 2407 | 29032 | 912 | - | 60316 |
| ඕලන්ද යුග කෞතුකාගාරය | 3861 | 286 | 748 | 19 | 20 | 149 | - | - | 5083 |
| රත්නපුර ජාතික කෞතුකාගාරය | 4373 | 1246 | 92 | 07 | 493 | 6439 | 82 | - | 12732 |
| මහනුවර ජාතික කෞතුකාගාරය | 9208 | 2118 | 3175 | 77 | 790 | 8626 | - | - | 23994 |
| ගාල්ල ජාතික කෞතුකාගාරය | 7234 | 1641 | 2815 | 124 | 982 | 11759 | 254 | - | 24809 |
| ජාතික සමුද්‍ර කෞතුකාගාරය | 9847 | 3122 | 2905 | 206 | 982 | 18011 | - | - | 35073 |
| ජන කෞතුකාගාරය අනුරාධපුරය | 1669 | 371 | 117 | - | 392 | 2357 | 844 | - | 5750 |
| නිදහස් අනුස්මරණ කෞතුකාගාරය | 8302 | 1212 | 542 | 61 | 2662 | 14697 | 1246 | - | 28722 |
| එකතුව | 134608 | 37225 | 42840 | Í740 | 17788 | 183852 | 8844 | - | 426897 |

## (5) විවිධ අංශවල කටයුතු:

### (අ) සංස්කෘතික අංශ:

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ සංස්කෘතික අංශය, මානවවංශ විද්‍යා හා මානව විද්‍යා යන අංශ දෙකෙන් සමන්විත වේ. එක් එක් අංශවලට අයත් භාණ්ඩ එක්රැස් කිරීම, ප්‍රදර්ශනය, ගබඩා කිරීම, සංරක්ෂණය, ලේඛනගත කිරීම, අධ්‍යයනය හා අධ්‍යාපනය ලබා දීම මෙම අංශය මගින් සිදු කෙරෙන ප්‍රධාන කාර්යයෝ වෙති.

## (1) මානවවංශ විද්‍යා අංශය.

### (අ) රැස්කිරීම් හා ලේඛන ගත කිරීම්

මානවවංශ විද්‍යා අංශය විසින් මේ වසරේදී රැස්කර ගන්නා ලද භාණ්ඩ හා ලේඛනගත කිරීම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | Accession Number | Objects | Quantity | Date | Locality | Gift or Purchase |
|---|---|---|---|---|---|---|
| 01 | 2013.1.1 | Brass Tray | 01 | 2012.12.31 | A.P.W.M.S.Vijitha Palamakumbura 250, Batapotha,Madelgamuwa, Gampaha. | Gift |
| 02 | 2013.2.1 | Brass Tobaco Box | 01 | 2012.12.31 | A.P.W.M.S.Vijitha Palamakumbura 250, Batapotha,Madelgamuwa, Gampaha. | Gift |
| 03 | 2013.3.1 | Gold Kahavanuva | 01 | 2013.01.15 | B.A.Aruna Dammika Kuttiyagolla,Baulla, Locality:Diuldamana, Polonnaruwa | Gift |
| 04 | 2013.4.1<br>2013.5.1<br><br>2013.6.1<br>2013.7.1<br>2013.8.1 | Ten Cents of Two Notes<br><br><br>Twenty Five Cent Note<br>Five Cent Note<br>A Coupon | 02<br><br><br>01<br>01<br>01 | 2013.01.28 | Mrs.Malkanthi No 60 /A/10 Suriyapaluwa, Kadawatha. | Purchase 12,000/= |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 05 | 2013.9.1<br>2013.10.1<br>2013.11.1<br>2013.12.1<br>2013.13.1<br>2013.14.1<br>2013.15.1<br>2013.16.1<br>2013.17.1<br>2013.18.1<br>2013.19.1<br>2013.20.1<br>2013.21.1<br>2013.22.1 | A Large Plate<br>A Large Plate<br>Circular Plate<br>Food Container<br>Finger bowl<br>Circular Plate<br>Circular Plate<br>Circular Plate<br>Oval shape plate<br>Oval shape Small Dish<br>Circular Plate<br>Circular Plate<br>Circular Plate<br>Circular Plate | 01<br>01<br>01<br>01<br>01<br>01<br>01<br>01<br>01<br>01<br>01<br>01<br>01<br>01 | 2013.02.08 | W.T.Lanka Priyamali<br>Habarakada(west)<br>Thawalama | Purchase<br>45,000/= |
| 06 | 2013.22.1 | A brass Sedent Buddha image | 01 | 2013.02.20 | Majistrate<br>Rambadagalla<br>Locality:Kulumullaw atta<br>Pallehorombuwa,<br>Ridigama | Gift |
| 07 | 2013.24.1<br><br><br>2013.24.2 | Malaya/Ja Dress<br>Male dress<br><br>Female dress | 02 | 2011.09.19 | Kalabhushana<br>Karthni Drahaman<br>Mohamed<br>"Mergeka", 23 A,<br>Guild ford Cresent,<br>Colombo 07. | Gift |
| 08 | 2013.25.1<br><br><br>2013.25.2<br><br><br>2013.25.3<br><br>2013.25.4 | A National Kit<br>A sleeved silk shirt<br><br>A cloth "Satakaya"<br><br><br>A cloth "Wettiya"<br><br>A cloth "Wettiya" | 04 | 2012.11.09 | K.N.T.Chandrasen<br>Dammulla,<br>Karadhana. | Gift |
| 09 | 2013.26.1<br><br><br>2013.26.2 | National Kit<br>Long sleeved white shirt<br><br>White cloth "Reddha" | 02 | 2012.11.15 | Proffesor. Vini<br>Vitharana<br>1/62, Samudrasanna Road,<br>Mount Levenia. | Gift |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 10 | 2013.27.1 | Long sleeved white shirt | 01 | 2012.11.19 | Mr.R.A.M.Jayasinha<br>102, Weragoda,<br>Pallewela | Gift |
| 11 | 2013.28.1<br><br>2013.28.2 | Dutch Burgher Dress<br>(replica)<br>Male dress<br>Lady dress | 02 | 2012.12.05 | The Orient design<br>(P.V.T)L.t.d<br>No:105,Hunupitiya<br>wewa Road,<br>Colombo 02. | Gift |
| 12 | 2013.29.1<br><br>2013.29.2 | A Jacket and Saree<br>A brown Jacket<br>A red Saree | 02 | 2012.12.10 | Dr.NandaPremathila<br>ka<br>3/2, Trevose on the<br>Green,<br>93, Isipathana<br>Mawatha,<br>Colombo.05 | Gift |
| 13 | 2013.30.1 | වයින් බෝතල්<br>මූඩි ගැලවීමට භාවිතා කළ<br>උපකරණයකි (ඇලුමිනියම්) | 01 | 2013.04.04 | එල්.පී.රොහාන් උපචිත්‍ර,<br>දිල්සිරි වත්ත,<br>හම්පේ, ගාල්ල. | පරිත්‍යාගයකි |
| 14 | 2013.31.1<br><br>2013.31.2<br><br>2013.31.3<br><br>2013.31.4<br><br>2013.31.5<br><br>2013.31.6<br>2013.31.7<br>2013.31.8<br>2013.31.9<br>2013.31.10<br>2013.31.11<br><br>2013.31.12<br><br>2013.31.13<br><br>2013.31.14<br><br>2013.31.15<br><br>2013.31.16<br><br>2013.31.17<br>2013.31.18<br><br>2013.31.19 | ක්‍රි.ව.1905 බ්‍රිතාන්‍ය තඹ<br>සතයේ කාසිය<br>ක්‍රි.ව.1892 බ්‍රිතාන්‍ය තඹ<br>සතයේ කාසිය<br>ක්‍රි.ව.1891 බ්‍රිතාන්‍ය තඹ<br>සතයේ කාසිය<br>ක්‍රි.ව.1890 බ්‍රිතාන්‍ය තඹ සත<br>පහ කාසිය<br>ක්‍රි.ව.1910 බ්‍රිතාන්‍ය තඹ<br>සතයේ කාසිය<br>ලන්දේසි කාසිය (ක්‍රි.ව.1753)<br>ලන්දේසි කාසිය (ක්‍රි.ව.1756)<br>ලන්දේසි කාසිය<br>ලන්දේසි කාසිය (ක්‍රි.ව.1766)<br>බ්‍රිතාන්‍ය කාසිය(ක්‍රි.ව.1802)<br>ක්‍රි.ව.1912 බ්‍රිතාන්‍ය තඹ<br>සතයේ කාසිය<br>ක්‍රි.ව.1917 බ්‍රිතාන්‍ය තඹ සත<br>භාගයේ කාසිය<br>ක්‍රි.ව.1919 බ්‍රිතාන්‍ය රිදී සත<br>විසිපහේ කාසිය<br>ක්‍රි.ව.1926 බ්‍රිතාන්‍ය තඹ සත<br>භාගයේ කාසිය<br>ක්‍රි.ව.1940 බ්‍රිතාන්‍ය තඹ සත<br>භාගයේ කාසිය<br>ක්‍රි.ව.1942 බ්‍රිතාන්‍ය තඹ<br>සතයේ කාසිය<br>බ්‍රිතාන්‍ය තඹ කාසිය<br>1 වන භුවනෙකබාහු රජුගේ<br>කාසිය<br>බ්‍රිතාන්‍ය තඹ කාසිය | 19 | 2013.01.01 | ඒ.ඩී.බන්දුපාල<br>526/A<br>කොළඹ පාර,<br>ගිං තොට. | පරිත්‍යාගයකි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 15 | 2013.32.1<br>2013.33.1<br>2013.34.1<br>2013.35.1<br>2013.36.1<br>2013.37.1<br>2013.38.1<br>2013.39.1<br>2013.40.1<br>2013.41.1<br><br>2013.42.1<br>2013.43.1<br><br>2013.44.1<br>2013.45.1<br><br>2013.46.1<br><br>2013.47.1<br><br>2013.48.1<br>2013.49.1<br>2013.50.1<br>2013.51.1<br>2013.52.1<br>2013.53.1<br>2013.54.1<br>2013.55.1<br>2013.56.1<br>2013.57.1 | යකඩ පැති පුල්ලෝරම<br>යකඩ පැති පුල්ලෝරම<br>යකඩ කතුරක්<br>යකඩ කතුරක්<br>මුළුමට්ටම<br>ඉරි ගහන කොම්පාසුව<br>දාර හුරන පිහිය<br>දාර හුරන පිහිය<br>දාර හුරන පිහිය<br>ලෙලි කපන පිහිය (මිට නැත)<br>ලෙලි කපන කියත<br>පෙන්ඩන් Press කරන මැෂිම<br>පෙට්ටි ලී අච්චු (ඕවලාකාර)<br>පෙට්ටි ලී අච්චු (බෝ කොළ හැඩැති)<br>පෙට්ටි ලී අච්චු (අළුවා කැට හැඩැති)<br>පෙට්ටි ලී අච්චු (වෘත්තාකාර හැඩැති)<br>පෙට්ටි ලී අච්චු (ඕවලාකාර)<br>හැන් බෑග් ලී අච්චු<br>මුදු හදන බන්දක්<br>යකඩ මුදු අඬුව<br>ලෙලි පාස්සන අඬුව<br>ලෙලි පාස්සන අඬුව<br>ලෙලි පාස්සන අඬුව<br>ලෙලි පාස්සන අඬුව<br>ලෙලි පාස්සන අඬුව<br>ලෙලි පාස්සන අඬුව | 01<br>01<br>01<br>01<br>01<br>01 | 2013.05.03 | අයි.එන්.බී.ලාල් ආනන්ද<br>කොස් ගොඩ වත්ත,<br>ඇත්තිලියගොඩ,<br>ගාල්ල. | පරිත්‍යාගයකි |
| 16 | 2013.58.1 | Clay item (Bummadiya) | 01 | 2013.05.11 | P.M.Senewirathne<br>Aluthgedara,<br>Walpalagolla,<br>Sangarajapura. | Gift |
| 17 | 2013.59.1 | One Tortoise - shell crescent shaped Comb | 01 | 2013.11.01 | Mr.V.K.G.A.Perera<br>No;138, Nagalagam Street,<br>Colombo 14. | Gift |

**(ඇ) පර්යේෂණ**

මානවවංශ විද්‍යා අංශය විසින් මේ වසරේදී කරන ලද පර්යේෂණ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

Dutch and other Foreign Tobacco Boxes of Sri Lanka National Museums. (Dr.K.D. Paranawithana and Senaratha Wicramasinghe ) ග්‍රන්ථය මුද්‍රණයට භාර දීම.

**(ඈ) ප්‍රදර්ශන.**

මානවවංශ විද්‍යා අංශය මගින් මේ වසරේදී ජංගම ප්‍රදර්ශන 10 ක් පවත්වන ලදී

**(ඉ) වැඩමුළු හා සම්මන්ත්‍රණ**

ශ්‍රී ලංකාවේ ඇමෙරිකානු මධ්‍යස්ථානය හා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව එක්ව කෞතුකාගාර ක්ෂේත්‍රයේ නියුතු නිලධාරීන්හට කෞතුකාගාර විද්‍යාව පිළිබඳ වැඩමුළුවක් 2013 ජූලි මස 23,24 සහ 25 යන දිනයන්හීදී පවත්වන ලදී.

**(ඊ) බාහිර සේවා.**

පාසැල් සිසුන්ගේ සහ විශ්ව විද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය තොරතුරු හා පර්යේෂකයින්ට අවශ්‍ය තොරතුරු ලබාදීම මානවවංශ විද්‍යා අංශය මගින් සිදුකර ඇත.

## (2) මානව විද්‍යා අංශය

**(අ) හඳුනාගැනීම් ලේඛන ගත කිරීම්**

මානව විද්‍යා අංශය මගින් මේ වසරේදී හඳුනාගැනීම් ලේඛන ගත කිරීම් සිදු කර නොමැත.

**(ආ) ක්ෂේත්‍ර චාරිකා** - ක්ෂේත්‍ර චාරිකා සිදු කර නැත.

**(ඇ) ස්ථිර ප්‍රදර්ශන හා ජංගම ප්‍රදර්ශන.**

- කොළඹ කෞතුකාගාරයේ වෙස් මුහුණු මැදිරිය සහ කරත්ත මැදිරිය සැකසීම සිදු කරන ලදී.
- මානව විද්‍යා අංශය මගින් මේ වසරේදී ජංගම ප්‍රදර්ශන 02 ක් පවත්වන ලදී.

**(ඈ) වෙනත් කටයුතු.**

- කෘෂිකාර්මික භාණ්ඩ එකතුව පිළිබඳ ග්‍රන්ථය මුද්‍රණය සඳහා භාර දීම.
- කෘෂිකාර්මික භාණ්ඩ එකතුව,සංගීත භාණ්ඩ එකතුව හා දේශීය වෛද්‍ය උපකරණ එකතුව ඡායාරූපගත කිරීම.
- මානව විද්‍යා භාණ්ඩ එකතුවේ දත්ත භාණ්ඩ ලියාපදිංචි කිරීමේ දත්ත ගොණුවට ඇතුලත් කරමින් පවතී.

**(ඉ) බාහිර සේවා.**

පාසැල් සිසුන්ගේ සහ දේශීය විදේශීය විශ්ව විද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය තොරතුරු හා පර්යේෂකයින්ට අවශ්‍ය තොරතුරු ලබාදීම මානව විද්‍යා අංශය මගින් සිදුකර ඇත.

## (ආ) විද්‍යාත්මක අංශ.

උද්භිද විද්‍යා, කීට විද්‍යා, භූ විද්‍යා, සත්ත්ව විද්‍යා යන අංශ මෙයට අයත් වේ. ඒ ඒ අංශවලට අයත් භාණ්ඩ හා ආදර්ශක රැස්කිරීම, නඩත්තු කිරීම, ප්‍රදර්ශනය, එම භාණ්ඩ හා ආදර්ශක පිළිබඳ පර්යේෂණ කරන්නා වු බාහිර විද්වතුන්ට සහයෝගය ලබාදීම හා ජනතාව දැනුවත් කිරීමේ කටයුතු මෙම අංශ මගින් කෙරෙන ප්‍රධාන කාර්යයෝ වෙති.

## (1). උද්භිද විද්‍යා අංශය.

**(අ) රැස්කිරීම් :**

ගාල්ල සමුද්‍රික කෞතුකාගාරය සඳහා ඇල්ගී ආදර්ශක රැස් කිරීම සිදු කරන ලදී.

- හරිත ඇල්ගී -
- දුඹුරු ඇල්ගී -
- රතු ඇල්ගී -

ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයේ උද්භිද විද්‍යා මැදිරියේ සහ ජෛව විවිධත්ව මැදිරියේ නවීකරණ කටයුතු සඳහා රැගෙන එන ලද ශාක වර්ග

- **C**leistanthus collinus
- Piper longum
- Artabotrys hexapetalus
- Lycopodium pulchemimum
- Sellaginella
- Ocimum tenuiflorum
- Sarcostemma bruyonianum
- Pinus
- සාම්ප්‍රදායික වී වර්ග
- මීවණ වර්ග කිහිපයක්

**(ආ) හඳුනාගැනීම් ලේඛන ගත කිරීම්**

- ගාල්ල සමුද්‍රික කෞතුකාගාරයේ දුර්වර්ණ වී තිබූ ඇල්ගී ආදර්ශක හඳුනා ගැනීම.
- ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයේ උද්භිද විද්‍යා මැදිරියේ සහ ජෛව විවිධත්ව මැදිරියේ නවීකරණ කටයුතු සඳහා රැගෙන එන ලද ශාක වර්ග සහ සාම්ප්‍රදායික වී වර්ග.
- රත්නපුර ජාතික කෞතුකාගාරයේ ඔසු උයනේ ශාක වර්ග හඳුනා ගැනීම.

**(ඇ) සංරක්ෂණය කරන ලද භාණ්ඩ හා ආදර්ශවල විස්තර**

- ගාල්ල සමුද්‍රික කෞතුකාගාරයේ දුර්වර්ණ වී තිබූ ඇල්ගී ආදර්ශක සංරක්ෂණය කර ප්‍රතිස්ථාපනය කිරීම.
- ජාතික ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයේ උද්භිද විද්‍යා මැදිරියේ නවීකරණ කටයුතු සඳහා රැගෙන එන ලද ශාක ආදර්ශක සංරක්ෂණය කරමින් පවතියි.

**(ඈ) පර්යේෂණ.**

- පර්යේෂණ සිදු කර නොමැත

**(ඉ) ක්ෂේත්‍ර චාරිකා**

- ගාල්ල සමුද්‍රික කෞතුකාගාරයේ ඇල්ගී ආදර්ශක ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දකුණු වෙරළ තීරයේ ක්ෂේත්‍ර චාරිකාවක නිරත විම.
- සාම්ප්‍රදායික තෙත් කලාපීය වී වර්ග රැස් කිරීම සඳහා හෝමාගම ප්‍රදේශයේ ක්ෂේත්‍ර චාරිකාවක නිරත විම.

**(ඊ) ජංගම ප්‍රදර්ශන.**

- ශ්‍රී ලංකාවේ විෂ සහිත ශාක යන මැයෙන් ජංගම ප්‍රදර්ශන 04 ක් පවත්වන ලදී.

**(උ) වැඩමුළු හා සම්මන්ත්‍රණ**

- ප්‍රාථමික අධ්‍යාපනයට කෞතුකාගාරයෙන් අත්වැලක් යන මැයෙන් දේශන 03 ක් පවත්වන ලදී.
- ස්වභාවික විද්‍යා කෞතුකාගාරය සංවිධානය කල වැඩමුළු 02 ක් සඳහා සහභාගි වීම.

**(ඌ) වෙනත් කටයුතු.**

- කෞතුකාගාර උද්‍යානයේ නඩත්තු කටයුතු අධීක්ෂණ කටයුතු සිදු කිරීම.
- ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ උද්භිද විද්‍යා මැදිරිය නවීකරණ කටයුතු සිදු කිරීම.
- ගාල්ල ජාතික කෞතුකාගාරයේ හා ගාල්ල සමුද්‍රික කෞතුකාගාරයේ අධීක්ෂණ කටයුතු සිදු කිරීම.
- රත්නපුර ජාතික කෞතුකාගාරයේ ඔසු උයනේ ශාක වර්ග හඳුනා ගැනීම සහ ලේබල් කිරීම සඳහා නිසි පරිදි නාම ලේබන සකස් කිරීම.

## (2) කීට විද්‍යා අංශය

### (අ) අදාළ වර්ෂය තුළ සිදුකරන ලද රැස් කිරීම්

| | සත්ත්ව කාණ්ඩය | විශේෂ ගණන | කුල ගණන | නිදර්ශක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | Scorpions | 1 | | 2 |
| 2 | Spiders | 2 | | 2 |
| 3 | Coleopterans | | 9 | 28 |
| 4 | Grasshoppers | | 5 | 9 |
| 5 | Butterflies | 5 | | 5 |
| 6 | Moths | | 4 | 4 |
| 7 | Blattodians | 1 | | 1 |
| 8 | Bugs | | 4 | 8 |
| 9 | Hymenoptera | 3 | | 5 |
| 10 | Caddis flies | 1 | | 2 |
| 11 | Centipieds | 1 | | 1 |
| 12 | Mantids | 2 | | 2 |
| 13 | Phasmids | 1 | | 1 |
| 14 | Dermaptera | 1 | | 1 |
| 15 | Neuroptera | 1 | | 1 |
| 16 | Tarantula | 1 | | 2 |
| එකතුව | | 20 | 23 | 74 |

### (ආ) හඳුනාගැනීම් හා ලේඛනගත කිරීම්

- මී මැස්සන් අයත් හයිමෙනොප්ටෙරා **(Hymenoptera)** ගෝත්‍රයේ නිදර්ශක ලැයිස්තු ගත කර පරිගණක ගත කිරීම.

## (ඇ) සංරක්ෂණය කරන ලද භාණ්ඩ හා ආදර්ශකවල විස්තර

- ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ කීට විද්‍යා මැදිරිවල අඩංගු නිදර්ශක පිරිසිදු කිරීම සහ සංරක්ෂණය කිරීම හා ලේබල් නවීකරණය කිරීම

## (ඈ) පර්යේෂණ

- පර්යේෂණ සිදු කර නොමැත.

## (ඉ) ක්ෂේත්‍ර චාරිකා -

- මහවැලි ව්‍යාපෘතියට අයත් කළුගඟ ව්‍යාපෘතිය සඳහා යට වන ප්‍රදේශ වල සතුන් එකතු කිරීම සඳහා ලග්ගල හා පල්ලේගම ප්‍රදේශ වලට යාම

## (ඊ) ස්ථිර/තාවකාලික හා ජංගම ප්‍රදර්ශන

- කීට විද්‍යා අංශය මගින් 2013 වර්ෂයේදී ජංගම ප්‍රදර්ශන 10 ක් පවත්වන ලදී.

## (උ) වැඩමුළු හා සම්මන්ත්‍රණ

- වනජීවී දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා වැඩමුළු දෙකක් පැවැත්වීම. (2013.03.13) ,(2013.09.12)
- 2013.11.27 වන දින හොරණ කලාපයේ විද්‍යා විෂය උගන්වන පාසල් ගුරුභවතුන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම.

## (ඌ) බාහිර සේවා

- පාසැල් සිසුන්ගේ සහ දේශීය විදේශීය විශ්ව විද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය තොරතුරු හා පර්යේෂකයින්ට අවශ්‍ය තොරතුරු ලබාදීම මානව විද්‍යා අංශය මගින් සිදුකර ඇත.

### (එ) වෙනත් කටයුතු

- කෞතුකාගාර උද්‍යානයේ සකස් කරන ලද සමනල උයන නඩත්තු කිරීම සහ එහි පැමිණෙන සමනලයන් ලැයිස්තු ගත කිරිම.
- පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨය මඟින් ගොඩ නැඟීමට යෝජිත විද්‍යා අධ්‍යයන සම්පත් මධ්‍යස්ථානයේ කීට විද්‍යා අංශයට අදාළ නිදර්ශක සකස් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් සහ දැනුම ලබා දීම.

## (3) භූවිද්‍යා අංශය.

### (අ) හඳුනාගැනීම් හා ලේඛන ගත කිරීම්.

- පැරණි ඛණිජ ලියාපදිංචි කිරීමේ ලේඛනය අපැහැදිලිව දිරාපත්ව ඇති නිසා නව ලියාපදිංචි කිරීමේ ලේඛනයක ඛණිජ වර්ග 300 ක් පිළිබඳ විස්තර ලේඛනගත කිරීම.

### (ආ) ජංගම ප්‍රදර්ශන.

- භූවිද්‍යා අංශය මගින් 2013 අම්පාරේ පැවති දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනය වෙනුවෙන් සඳගල් ප්‍රදර්ශනය පවත්වන ලදී.

### (ඇ) බාහිර සේවා.

- පාසැල් හා විශ්ව විද්‍යාල සිසුන් හා පර්යේෂකයන්ට අවශ්‍ය තොරතුරු ලබාදීම.

### (ඈ) වෙනත් කටයුතු

- භූවිද්‍යා ප්‍රදර්ශන මැදිරි නවීකරණයේදී අවශ්‍ය වන ප්‍රදර්ශන පුවරු පිළියෙල කිරීම සඳහා අවශ්‍ය තොරතුරු රැස්කිරීම.

(ඉ) වැඩමුළු හා සම්මන්ත්‍රණ

- බස්නාහිර පළාතේ පාසැල් විද්‍යාගාරවල සේවය කරන විද්‍යාගාර සේවක භවතුන් සඳහා පහත සඳහන් දින වලදී ඛනිජ,පාෂාණ,පොසිල නිදර්ශක පිළියෙල කිරීම පිළිබඳව විද්‍යාත්මක පුහුණුවක් භූවිද්‍යා අංශය තුලදී ලබාදීම.
- 2013.11.27 යන දින හොරණ කලාපයේ විද්‍යා විෂය උගන්වන ගුරුභවතුන් සඳහා ඛනිජ,පාෂාණ හා පොසිල පිළිබද වැඩමුළුවක් පැවැත්වීම.

## (4) සත්ත්ව විද්‍යා අංශය

### (අ) අදාළ වර්ෂය තුළ සිදුකරන ලද රැස් කිරීම්.

- මහවැලි ව්‍යාපෘතියට අයත් කළුගඟ ව්‍යාපෘතිය සඳහා යට වන ප්‍රදේශ වල සතුන් එකතු කිරීම.
- පර්යේෂක මෙන්ඩිස් වික්‍රමසිංහ මහතා විසින් ලබා දුන් Pseudophylotus ගණයට අයත් ගෙඹි නිදර්ශක 10 ක් සහ Cnemaspis ගණයට අයත් හූණු නිදර්ශකයක් භාර ගැනීම.
- පර්යේෂක සුදේශ් බටුවිට මහතා විසින් ලබා දුන් Rasboroides ගණයට අයත් මත්ස්‍ය නිදර්ශක 14 ක් භාර ගැනීම.
- ඇන්ස්ලම් ද සිල්වා මහතා විසින් භාර දුන් මුහුදු සර්පයන් 188 ක් භාර ගැනීම.

### (ආ) හඳුනාගැනීම් හා ලේඛනගත කිරීම්

- දිවයිනේ විවිධ ප්‍රදේශවල අධිකරණවලින් ගෙනෙන ලද සත්ත්ව ආදර්ශක සහ සත්ත්ව කොටස් හඳුනා ගැනීම හා රාජසන්තක කරන ලද භාණ්ඩ ලේඛන ගත කිරීම.
- පර්යේෂක මෙන්ඩිස් වික්‍රමසිංහ මහතා විසින් ලබා දුන් Pseudophylotus ගණයට අයත් ගෙඹි නිදර්ශක 10ක් සහ Cnemaspis ගණයට අයත් හූණු නිදර්ශකයක් ලේඛන ගත කිරීම.
- පර්යේෂක සදේශ් බටුවිට මහතා විසින් ලබා දුන් Rasboroide ගණයට අයත් මත්ස්‍ය නිදර්ශක 14 ක් නිදර්ශක ලේඛන ගත කිරීම.
- ඇන්ස්ලම් ද සිල්වා මහතා විසින් භාර දුන් මුහුදු සර්පයින් ලේඛන ගත කිරීම.

## (ඇ) සංරක්ෂණය කරන ලද භාණ්ඩ හා ආදර්ශකවල විස්තර

- යෝජිත ත්‍රිකුණාමලය නාවික ඉතිහාස කෞතුකාගාරයේ ජෛව විවිධත්ව මැදිරිය සැකසීම සඳහා මුහුදු බෙල්ලන් සහ කොරල් සංරක්ෂණය කිරීම.
- චර්ම ශිල්පි අංශයේ ඇති බැටට කුරුළු එකතුව සංරක්ෂණය කිරීම.
- ක්ෂීරපායි එකතුව නැවත සංරක්ෂණය කර පොලිතීන් යොදා ආවරණය කිරීම.
- ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ ඇති හෙයියන්තුදුවේ රාජා ඇතාගේ සැකිල්ල පිරිසිදු කර සංරක්ෂණය කිරීම.
- සත්ත්ව විද්‍යා රසායනාගාරයේ ඇති තෙත් ආදර්ශක එකතුව සංරක්ෂණය කිරීම.
- සත්ත්ව විද්‍යා අංශය සතු WHT තෙත් ආදර්ශක එකතුව ඇල්කොහොල් දමා සංරක්ෂණය කිරීම.
- මුහුදු උරග නිදර්ශක එකතුව ඇල්කොහොල් දමා සංරක්ෂණය කිරීම.
- ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ ඇති ඇත් පැටවා ඇතුළු නිදර්ශක කීපයක් යාවත්කාලීන කිරීම.
- හෙයියන්තුඩුව ඇතාගේ සැකිල්ල සංරක්ෂණය කර ප්‍රදර්ශන මට්ටමට සැකසීම.
- තලගොයා,ඩොල්පින්,ගවයා,ඕලු මුවා ,දියබල්ලා යන සතුන්ගේ අස්ථි සැකිලි සැකසීම ආරම්භ කිරීම.
- පෙදුරාජ්‍ය මණ්ඩලීය සමුළුව නිමිත්තෙන් ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ සත්ත්ව විද්‍යා මැදිරියට සංරක්ෂණය කරන ලද ගවරාගේ සහ කුළු මී හරකාගේ ශීර්ෂ ආදර්ශක භාණ්ඩ ලෙස තැන්පත් කිරීම.
- ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ සත්ත්ව විද්‍යා මැදිරිවල අඩංගු නිදර්ශක පිරිසිදු කිරීම සහ සංරක්ෂණය කිරීම හා ලේබල් නවීකරණය කිරීම.

## (ඈ) පර්යේෂණ

පර්යේෂණ සිදු කර නොමැත.

## (ඉ) ක්ෂේත්‍ර චාරිකා

- මහවැලි ව්‍යාපෘතියට අයත් කළුගඟ ව්‍යාපෘතිය සඳහා යට වන ප්‍රදේශ වල සතුන් එකතු කිරීම සඳහා ලග්ගල හා පල්ලේගම ප්‍රදේශ වලට යාම
- ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ යෝජිත අස්ථික විද්‍යා මැදිරියට අවශ්‍ය මී හරක් අස්ථි සැකිල්ල ගොඩගැනීමට රදාවානට යාම.
- ඕලු මුවා සහ හම්බාවාගේ අස්ථි සැකිලි ලබා ගැනීමට ගාල්ල හියාරේ වනජීවී සංරක්ෂණ සංගමය වෙත යාම.
- මැරුණු වලසකුගේ අස්ථි සැකිල්ල ලබා ගැනීමට සිලාවතුර ප්‍රදේශයට යාම.

## (ඊ) ස්ථිර/තාවකාලික හා ජංගම ප්‍රදර්ශන

- සත්ත්ව විද්‍යා අංශය මගින් 2013 වර්ෂයේදී ජංගම ප්‍රදර්ශන 10 ක් පවත්වන ලදී.

## (උ) වැඩමුළු හා සම්මන්ත්‍රණ

- වනජීවී දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා වැඩමුළු දෙකක් පැවැත්වීම. 2013.03.13 සිට 2013.09.12
- 2013.11.27 වන දින හොරණ කලාපයේ විද්‍යා විෂය උගන්වන පාසල් ගුරුභවතුන් සඳහා වැඩමුළුවක් පැවැත්වීම.

## (ඌ) බාහිර සේවා

- පාසැල් සිසුන්ගේ සහ දේශීය විදේශීය විශ්ව විද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය තොරතුරු හා පර්යේෂකයින්ට අවශ්‍ය තොරතුරු ලබාදීම මානව විද්‍යා අංශය මගින් සිදුකර ඇත.

## (එ) වෙනත් කටයුතු

- දිවයිනේ විවිධ ප්‍රදේශ වල අධිකරණ මගින් රැගෙන එන සත්ත්ව ආදර්ශක හඳුනාගැනීම හා ඒ පිළිබද වාර්තාවන් සැකසීම
- කොළඹ මහ නගරසභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක ලබා දුන් පාර්සලයේ තිබුණු සත්ත්ව කොටස හඳුනාගෙන ඒ පිළිබඳ වාර්තාව සකස්කර යැවීම.
- හෙයියන්තුඩුවේ රාජා හස්තියාගේ සැකිල්ල මහජනතාවට ප්‍රදර්ශනය කිරීමේ කටයුතු සම්පාදනය කිරීම.
- ත්‍රිකුණාමලය යෝජිත නාවික ඉතිහාසය කෞතුකාගාරයේ ජෛව විවිධත්ව මැදියේ වැඩ කටයුතු නිමකොට භාර දීම.
- ගාල්ල සමුද්‍ර කෞතුකාගාරයේ බිත්තියක නුග මුල ඉවත් කිරීමට කටයුතු කිරීමේදී එම ස්ථාන වල තිබූ මත්ස්‍ය,මුහුදු බෙල්ලන් ප්‍රදර්ශන කුටි ඉවත් කිරීම සහ බිත්තිය අලුත්වැඩියාවෙන් පසු එම ප්‍රදර්ශන පුවරු සහ කුටි ප්‍රතිස්ථාපනය කිරීම.
- ගාල්ල ජාතික කෞතුකාගාරයේ ෂෙංහෝ ප්‍රදර්ශන කුටිය සැකසීමට උපකාර වීම.

## (ඇ) අධ්‍යාපන හා ප්‍රකාශන අංශය.

### (1) අධ්‍යාපන සම්මන්ත්‍රණ, වැඩමුළු හා දේශන

අධ්‍යාපන හා ප්‍රකාශන අංශය මගින් මෙම වසරේදී පාසැල් 03 ක් සඳහා ශ්‍රී ලංකාවේ ඉතිහාසය හා කලාශිල්ප පිළිබඳ අධ්‍යාපනික සම්මන්ත්‍රණ සංවිධානය කරන ලදී. ඒවා පහත පරිදි වේ.

### අධ්‍යාපනික සම්මන්ත්‍රණ

- 2013/07/30 දින - ක්‍රිස්තුරාජ ජාතික පාසලේ සිසුන් සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණය
- 2013 /07/31 දින - පල්ලේගම ආනන්ද විද්‍යාලයේ සිසුන් සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණය
- 2013 /08/01 දින - තුඩැල්ල ශ්‍රී විජය මහා විද්‍යාලයේ සිසුන් සඳහා අධ්‍යාපනික සම්මන්ත්‍රණය

### (2) කෞතුකාගාර ජංගම ප්‍රදර්ශන

මෙම වසර තුළදී අධ්‍යාපන හා ප්‍රකාශන අංශය මගින් කෞතුකාගාර ජංගම ප්‍රදර්ශන 02 ක් සංවිධානය කරන ලද අතර පහත සඳහන් ස්ථානයන්හි ඒවා ප්‍රදර්ශනය කරන ලදී.

| | |
|---|---|
| 2013/03/01-11 | දැයට කිරුළ සංවර්ධන ප්‍රදර්ශනය (අම්පාර) |
| 2013/05/23-28 | අමරවංශ පිරිවෙන(ගණේමුල්ල) |

## (3) ප්‍රකාශන කටයුතු

මෙම වසර තුළදී අධ්‍යාපන හා ප්‍රකාශන අංශය මගින් මුද්‍රණය කරන ලද ප්‍රකාශන පහත පරිදි වේ.

1. කොළඹ ජාතික කෞතුකාගාර සිංහල අත්පත්‍රිකාව
2. කොළඹ ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාර සිංහල අත්පත්‍රිකාව
3. මහනුවර ජාතික කෞතුකාගාර සිංහල අත්පත්‍රිකාව
4. රත්නපුර ජාතික කෞතුකාගාර සිංහල අත්පත්‍රිකාව
5. ගාල්ල ජාතික කෞතුකාගාර සිංහල අත්පත්‍රිකාව
6. අනුරාධපුර ජන කෞතුකාගාර සිංහල අත්පත්‍රිකාව
7. ගාල්ල සමුද්‍ර කෞතුකාගාර සිංහල අත්පත්‍රිකාව
8. ඕලන්ද කෞතුකාගාර සිංහල අත්පත්‍රිකාව
9. නිදහස් අනුස්මරණ කෞතුකාගාර සිංහල අත්පත්‍රිකාව
10. කොළඹ ජාතික කෞතුකාගාර ඉංග්‍රීසි අත්පත්‍රිකාව
11. කොළඹ ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාර ඉංග්‍රීසි අත්පත්‍රිකාව
12. මහනුවර ජාතික කෞතුකාගාර ඉංග්‍රීසි අත්පත්‍රිකාව
13. රත්නපුර ජාතික කෞතුකාගාර ඉංග්‍රීසි අත්පත්‍රිකාව
14. ගාල්ල සමුද්‍ර කෞතුකාගාර ඉංග්‍රීසි අත්පත්‍රිකාව
15. ඕලන්ද කෞතුකාගාර ඉංග්‍රීසි අත්පත්‍රිකාව
16. Traditional Betel – Bags in Sri Lanka National Museum
17. Tamil Inscription in the Colombo National Museum
18. Spolia Zeylanica Vol. 46
19. Spolia Zeylanica Vol. 47
20. අම්පාරේ ජනකතා

## (4) ප්‍රකාශන අලෙවිය.

මෙම වසර තුළදී ප්‍රකාශන අලෙවියෙන් ලබා ඇති මුළු ආදායම රු. 631123.30 කි.

## (ඈ) ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරය

ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරය මේ වසරේදී බාහිර ආයතන 28 ක් සඳහා කුලියට දෙන ලද අතර එයින් ලද ආදායම රු. 346,000.00 කි.

## (ඉ) ජාතික කෞතුකාගාර පුස්තකාලය.

### (අ) අත්කරගැනීම්

මෙම වසර තුළදී ජාතික කෞතුකාගාර පුස්තකාලයට ලැබුණු ග්‍රන්ථ පහත පරිදි වේ.

( ඇමුණුම 01 බලන්න)

### (ආ) පොත් බැදීම්, සූක්ෂම සේයාපටල ගතකිරීම් හා ඡායා පිටපත්.

මෙම වසර තුළදී පුස්තකාලය මගින් බඳින ලද පොත් සංඛ්‍යාව 08 කි. ඩිජිටල් ඡායාරූපගත කරන ලද පොත් සංඛ්‍යාව 06 කි. ඩිජිටල් ඡායාරූපගත කරන ලද පුස්කොල පොත් සංඛ්‍යාව 12 කි. පාඨකයින් සඳහා ඡායා පිටපත් 12999 ක් නිකුත් කරන ලදී.

## (ඇ) පාඨක සංඛ්‍යාව

මෙම වසර තුළදී ජාතික කෞතුකාගාර පුස්තකාලයේ ස්ථිර සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව 23 . සාමාජිකත්වය අළුත් කරගත් සංඛ්‍යාව 06. තාවකාලික සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව 50. සාමාජිකත්වය තාවකාලිකව දීර්ඝ කරගත් සංඛ්‍යාව 01 කි.මෙම වසර තුළදී ජාතික කෞතුකාගාර පුස්තකාලයට පැමිණි මුළු පාඨක සංඛ්‍යාව 2374 කි.

## (ඈ) ආදායම

මෙම වසර තුළදී ජාතික කෞතුකාගාර පුස්තකාලයේ මුළු ආදායම රුː 205226.00 කි.

## (ඉ) අධ්‍යාපන කටයුතු

- කැළණිය විශ්ව විද්‍යාලයේ සිසුන් පිරිසක් සඳහා පුස්තකාලයේ සේවාවන් පිළිබඳ අවබෝධයක් ලබා දීම.

## (ඊ) ඡායාරූප අංශය.

ඡායාරූප අංශය මගින් මෙම වසරේදී

- ඡායාරූප ගත කිරීම් - 7450 කි
- සංයුක්ත තැටි (CD) - 7450 කි
- විවිධ අංශ සඳහා (ඩිජිටල්) ඡායාරූප පිටපත් - 3106 කි
- කෞතුකාගාර පුස්තකාලයේ ඇති ඉපැරණි පොත් සහ පුස්කොළ පොත්වලින් ඡායාරූප නිකුත් කරන ලද ප්‍රමාණය - 545 කි
- කෞතුක භාණ්ඩවල ඡායාරූප නිකුත් කරන ලද ප්‍රමාණය - 190 කි

## (උ) සංරක්ෂණ අංශය

### (අ) 2013 වසරේ සංරක්ෂණය කරන ලද භාණ්ඩ :

- **මානව වංශ විද්‍යා අංශය**

| | |
|---|---|
| • කාසි | |
| • චීන කාසි | 661 |
| • විජයබාහු කාසි | 100 |
| • මාන්තායි වලින් ලැබුනු කාසි | 39 |
| • රෙදි පිළි | 11 |
| • සෙරමික් භාණ්ඩ | 158 |
| • ආහාර පාන ගැනීම සඳහා භාවිතා කරන භාණ්ඩ | 25 |
| • ලෝකඩ පහන් එකතුව | 66 |
| • ලෝකඩ භාණ්ඩ | 18 |

- **මානව විද්‍යා අංශය**

| | |
|---|---|
| • වෙස් මුහුණු | 14 |
| • කරත්ත | 12 |
| • බෙර | 01 |
| • අවි අත්ත | 01 |
| • අවි තොප්පිය | 01 |
| • කොල්ලෑව සහිත ඔරුවක ආකෘතිය | 01 |
| • දැවයෙන් සාදන ලද උකුස්සා රූපය | 01 |



විශාල ප්‍රමාණයේ චීන බුදම

(සංරක්ෂණයට පෙර)



සංරක්ෂණය කරන අවස්ථාව



සංරක්ෂණයට පසු

- **කොළඹ කෞතුකාගාරය**

- දැවමය භාණ්ඩ මැදිරියේ භාණ්ඩ - 67
- තොළුවිල බුද්ධ ප්‍රතිමාව
- ග්‍රෙගරි පිළිමය
- විශාල ප්‍රමාණයේ උක් හකුරු උණුකරන ලෝකඩ බඳුන
- කෞතුකාගාරය විවෘත කිරීමේ විස්තර ඇතුලත් කිරිගරුඬ සමරු ඵලකය
- පොදු රාජ්‍ය මණ්ඩලයේ නායකයින්ගේ සමූහ ඡායාරූපය
- නිකවලමුල්ලෙන් ගෙන එන ලද විශාල ප්‍රමාණයේ මැටි සොහොනක්
- සූර්ය දේව ප්‍රතිමාව

- **චර්ම ශිල්පී අංශය**

- පී. ඊ .පී .දැරණියගල මහතා විසින් අඳින ලද විශාල ප්‍රමාණයේ තෙල් සායම් චිත්‍රය

- **භූ විද්‍යා අංශය**

- ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇති භූ විද්‍යා අංශයට අයත් විශාල ප්‍රමාණයේ ගෝන අං තට්ටුව.

- **පුස්තකාලය**

| | |
|---|---|
| • ඉපැරණි පොත් | 23 |
| • ධූමායනය කරන ලද පොත් සහ සඟරා | 1700 |
| • වෙනත් අංශවල පොත් බැඳීම්,දිලීර ඉවත් කිරීම් සහ තහවුරු කිරීම් කටයුතු | 376 |
| • ලිපි ගොනු කවර සැකසීම | 267 |

- **ප්‍රාදේශීය කෞතුකාගාරවල සංරක්ෂණ කටයුතු**

- මහනුවර ජාතික කෞතුකාගාරයේ සංරක්ෂණ කටයුතු 2013 මැයි මස 09 -10-11
- විශාල ප්‍රමාණයේ ලෝකඩ පහන් තෛල පෙට්ටි සහ විශාල ප්‍රමාණයේ කල ඇතුළු භාණ්ඩ -3

- **ගාල්ල ජාතික කෞතුකාගාරයේ සංරක්ෂණ කටයුතු**

- පළමු ක්ෂේත්‍ර චාරිකාව - භාණ්ඩ 40 (2013 සැප්තැම්බර් 05 - 06)
- දෙවන ක්ෂේත්‍ර චාරිකාව - භාණ්ඩ 13 (2013 නොවැම්බර් 22)

- **ක්ෂේත්‍ර චාරිකා**

- පානදුර බෙල්ලන රජමහ විහාරයේ ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන්ට අයත් කෞතුකවස්තු 16 සංරක්ෂණය කිරීම - 2013 පෙබරවාරි මස 13 -14 -15 යන තෙදින

- **මැදිරි නවීකරණ කටයුතු**

- රෙදිපිළි 102 ක් ඇතුළු රෙදිපිළි සහ සෙරමික් භාණ්ඩ ගැලරියේ සියළුම භාණ්ඩවල ප්‍රදර්ශන / සංරක්ෂණ / කටයුතු සහ සවිකිරීම් (Mounting) කටයුතු සඳහා සෘජු දායකත්වය සැපයීම.
- ලක්සල මැදිරි අළුත්වැඩියා කටයුතු සහ මානව විද්‍යා අංශයට අයත් ඉපැරණි කරත්ත එකතුව සංරක්ෂණය කිරීම .
- ගෘහ භාණ්ඩ මැදිරියේ නවීකරණ කටයුතු සිදුකෙරෙන අතර එහි භාණ්ඩ 67 ක් පමණ සංරක්ෂණය කිරීම.

- **බාහිර සේවා**

- අධ්‍යක්ෂතුමිය (වැ. බ) අධීක්ෂණය යටතේ පිළියෙල කරන ලද ඇස්තමේන්තුවට අනුව A 4 ප්‍රමාණයේ පිටු 238 ක් ඇතුලත් වයඹ පළාත් සෞඛ්‍යා සේවා දෙපාර්තමේන්තුවට අයත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය ඉතිහාසය ඇතුලත් පර්යේෂණ ග්‍රන්ථය සංරක්ෂණය කිරීම.
- වලිසිංහ හරිස්චන්ද්‍ර කෞතුකාගාරයට අයත් ඉපැරණි ලියවිල්ලක් සංරක්ෂණය කිරීම.

- **වෙනත් කටයුතු**

- විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යවන්ට හා පර්යේෂකයන්ට වරින් වර සංරක්ෂණය පිළිබඳ ප්‍රායෝගික හා න්‍යයාත්මක දැනුම ලබා දීම.
- බෝපැළ මර්ධන කටයුතු සිදුකිරීම.
- වේයන් මර්ධන කටයුතු සිදුකිරීම හා අධීක්ෂණය.

## (උ) මෝස්තර සම්පාදක අංශය

- ත්‍රිකුණාමලය නාවික යුග ඉදිකිරීමට තිබූ ප්‍රදර්ශන මැදිරි ඉදි කිරීම 2013 ජනවාරි මාසයේ සිදුකල අතර පෙබරවාරි මාසයේ මුල් කාලයේ එම මැදිරිවල පැවති සියලු අඩුපාඩු සකස්කර අවසන් කරන ලදී .
- ස්වභාවික විද්‍යා කෞතුකාගාරයට අවශ්‍යව තිබූ තුන්පත් රෑන සිතුවම 2013 මාර්තු මාසයේ ආරම්භ කළ අතර ජූනි මාසයේ දී හා එය අවසන් කර භාරදෙන ලදී.
- 2013 ජූනි මාසයේ ගාල්ල සමුද්‍ර කෞතුකාගාරයේ මැදිරිය අලුත්වැඩියා කිරීම නිසා නැවත ප්‍රදර්ශන පුවරු සකස් කිරීම.
- 2013 ජූලි මාසයේ වෙස් මුහුණු මැදිරියේ නැවත ඉදිකෙරෙන ප්‍රදර්ශන කටයුතු වල රාජකාරි ආරම්භ කළ අතර නැවත අගෝස්තු මාසයේ ගාල්ල ජාතික කෞතුකාගාරයේ චීන මැදිරියේ ඉදිකිරීම් සිදු කළහ .
- අගෝස්තු මාසයේ නැවත වෙස්මුහුණු මැදිරියේ වැඩ කටයුතු ආරම්භ කරනු ලැබූ අතර පසුව නොවැම්බර් මාසය වන තුරු එම රාජකාරි සිදු කරන ලදී.

## (ඵ) ප්‍රලේඛන අංශය.

ප්‍රලේඛන අංශය මගින් මෙම වසරේදී පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

- ස්වභාවික විද්‍යා අංශයේ ආදර්ශක 39 ක් (2013.01.01.NH සිට 2013.61.1 NH දක්වා) මධ්‍යම අත්පත් කරගැනීමේ ලේඛනයේ ලියාපදිංචි කිරීම.
- කලා අංශයේ කෞතුක භාණ්ඩ 86 ක් (2013.01.01.NH සිට 2013.61.1 NH දක්වා) මධ්‍යම අත්පත් කරගැනීම් ලේඛනයේ ලියාපදිංචි කිරීම.
- ඉහත 1 හා 2 ට අදාල පරිත්‍යාග සඳහා සහතික පත්‍ර නිකුත් කිරීම.
- දෙපාර්තමේන්තුවේ පරිගණක අලුත්වැඩියාව හා නඩත්තු කටයුතු සම්බන්ධීකරණය කිරීම .
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය (www.museum.gov.lk ) සඳහා නවතම පුවත් අපේ උරුමය කාර්ය මණ්ඩල තොරතුරු පුරප්පාඩු කෞතුකාගාර චාරිකා යාවත්කාලීන කිරීම .
- රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය ( 1919 / www.gic.gov.lk) සඳහා දත්ත යාවත්කාලීන කිරීම.
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩල හැඳුනුම්පත් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම.
- ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩල තොරතුරු ඇතුළත් දත්ත සංචිතයක් නිර්මාණය කර අවශ්‍ය පරිදි යාවත්කාලීන කිරීම.
- ඉහත 8 දත්ත සංචිතයේ තොරතුරු අවශ්‍ය අවස්ථාවන්හිදී අදාල පාර්ශවයන්ට ලබා දීම.
- අනුමැතිය සහිතව කෞතුක භාණ්ඩ වල ඡායාරූප පර්යේෂකයන්ට හා වෙනත් බාහිර පුද්ගලයන්ට නිකුත් කිරීම.

## (ඒ) කෞතුකාගාරවල කටයුතු.

### (1) කොළඹ ජාතික කෞතුකාගාරය.

මේ වසරේදී කොළඹ ජාතික කෞතුකාගාරයේ රෙදිපිළි හා සෙරමික් මැදිරිය මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කරන ලද අතර රූකඩ මැදිරියේ ප්‍රදර්ශන සැලසුම් නිම කරන ලදී. 2013.03.28 දින කඩා වැටුණු තරප්පු පෙළ හා C.C.T.V පද්ධතියේ නවීකරණ කටයුතු සිදු කිරීම. ඉහල මාලයේ පවත්නා භායන කාරක පිටු දැකීම සඳහා තත්ව සමීක්ෂණයක් පැවැත්වීම. සියත FM නාලිකාව සහ ඩයලොග් ටී.වී. ආයතනය මගින් අධ්‍යාපනික වැඩසටහන් සඳහා රූපවාහිනී පටිගත කිරීම් සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ පැවති පොදුරාජ්‍යය මණ්ඩලීය රාජ්‍යය නායක සමුළුවේ සමාරම්භක උත්සවයට පැමිණි බ්‍රිතාන්‍යයේ චාල්ස් කුමරු කොළඹ ජාතික කෞතුකාගාරය නැරඹීමට පැමිණෙන ලදී.





**2013/05/17 වන දින රෙදිපිළි හා සෙරමික් ප්‍රර්ශන මැදිරිය විවෘත කිරීම.**





2013/11/15 වන දින චාල්ස් කුමරු කොළඹ ජාතික කෞතුකාගාරය නැරඹීමට පැමිණි අවස්ථාව.

## (2) ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය.

ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය මගින් මෙම වසරේදී සත්ත්ව විද්‍යා අංශය, උද්භිද විද්‍යා අංශය සහ කීටවිද්‍යා අංශය එකාබද්ධව අධ්‍යාපනික සම්මන්ත්‍රණ ,දේශන සහ වැඩමුළු 07 ක් පවත්වන ලදී. පාසැල් සිසුන්ගේ හා විශ්ව විද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති සඳහාත් පර්යේෂකයින් සඳහාත් තොරතුරු ලබාදීම සිදු කරන ලදී. 2013.01.29 වන දින හෙයියන්තුඩුවේ හස්තිරාජයාගේ අස්ථි සැකිල්ල මහජනතාව සඳහා විවෘත කරන ලදී. කෞතුකාගාරය තුළ අස්ථි විද්‍යා ගොඩනැගිල්ල සඳහා මුල්ගල තැබීම 2013.05.30 වන දින සිදු කරන ලද අතර. 2013.06.26 වන දින ජාතික ඉංජිනේරු තාක්ෂණ උරුම මැදිරිය විවෘත කරන ලදී.

## (3) ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය.

ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය මගින් පළාතේ පාසැල් සිසුන්ගේ හා විශ්ව විද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති සඳහාත් පර්යේෂකයින් සඳහාත් අවශ්‍ය තොරතුරු ලබාදීම හා වීඩියෝ චිත්‍රපට ඉදිරිපත් කිරීම සිදුකරන ලදී. ගාල්ල සමුද්‍ර කෞතුකාගාරයේ දිරාපත් වූ ප්‍රධාන පිවිසුම් දොරටුව අලුතින් සවි කිරීම සිදු කරන ලදී.

## (4) මහනුවර ජාතික කෞතුකාගාරය.

මහනුවර කෞතුකාගාරයේ මැදිරිභාරකරු තනතුරෙහි සේවය කරන පී.එම්.සෙනෙවිරත්න මහතා විසින් පරිත්‍යාග කරන ලද බුම්මැඩිය (ලි.ප.අ.2013.58.1) මහනුවර ජාතික කෞතුකාගාරයට මෙම වසරේදී අත්පත් කරගන්නා ලදී. මෙම වසරේදී අධ්‍යාපනික දේශන,වැඩමුළු සහ පාසැල් සිසුන්ගේ ව්‍යාපෘති සඳහා තොරතුරු ලබාදීමත් සිදුකර ඇත. Heritage Television Network මගින් කරන ලද වාර්තාමය වැඩසටහනට සහ ශ්‍රී දළදා මාළිගාවේ මාධ්‍ය අංශය මගින් අන්තර් ජාලයට මුදාහැරීම සඳහා කෞතුකාගාරයේ වීඩියෝගත කිරීම් සිදුකරන ලදී. වට තාප්පයේ තීන්ත ආලේප කිරීම සහ කෞතුකාගාර ගොඩනැගිල්ලෙහි අබලන්ව තිබූ ස්ථාන කිහිපයක් ප්‍රතිසංස්කරණය කරන ලදී. එසේම මල්වතු මහාවිහාරයේ කෞතුකාගාරය සැලසුම් කිරීම, නාම පුවරු සැකසීම, ආලෝකකරණය, ප්‍රදර්ශන අල්මාරි හා පාදස්ථල සැකසුම ආදී කටයුතු සිදු කරන ලදී.





**2013/01/29 වන දින හෙයියන්තුඩුවේ හස්තිරාජයාගේ අස්ථි සැකිල්ල මහජනතාව සඳහා විවෘත කිරීම.**






**2013/06/26 වන දින ජාතික ඉංජිනේරු තාක්ෂණ උරුම මැදිරිය විවෘත කිරීම.**

### (5) ඕලන්ද කෞතුකාගාරය

ඕලන්ද කෞතුකාගාරය මගින් මෙම වසරේදී පාසැල් සිසුන් හා විශ්ව විද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති සඳහා තොරතුරු ලබාදීම සහ සංචාරක මග පෙන්වන්නන් සඳහා දැනුවත්කිරීමේ වැඩසටහන් සිදුකර ඇත. ස්වාධීන රූපවාහිනිය සේවය හා සිරස මාධ්‍ය ආයතනයේ වාර්තා වැඩසටහන් පටිගත කරන ලදී. ඕලන්ද කෞතුකාගාරයේ කාර්යාල කාමර, තරප්පු පෙළවල් තුනක් හා සොල්දරය අලුත් වැඩියා කරන ලදී.

### (6) රත්නපුර ජාතික කෞතුකාගාරය.

රත්නපුර ජාතික කෞතුකාගාරය මගින් පාසැල් සිසුන්ගේ, විශ්ව විද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති සහ පර්යේෂකයින් සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීමත් දේශන, ප්‍රදර්ශන හා වැඩමුළු ද පවත්වා ඇත. ජාතික තරුණ සේවා සභාවේ දේශිය තරුණ හුවමාරුව 2013 සඳහා යාපනයේ සිට පැමිණි දරුවන්ට අවශ්‍ය ආයතනික සහය ලබා දීම සිදු කරන ලදී.

### (7) අනුරාධපුර ජන කෞතුකාගාරය.

අනුරාධපුර ජන කෞතුකාගාරය මෙම වසරේදි පාසැල් සිසුන්ගේ ව්‍යාපෘති සඳහා තොරතුරු ලබාදීමත්, නුවර කලාවියේ ගැමි ජීවිතය පිළිබඳ දේශන හා වැඩමුළු ද පවත්වා ඇත. අනුරාධපුර ජන කෞතුකාගාර කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු අවසාන අදියරේ පැවතීම හා ගැමිගෙයි යම් යම් නවීකරණ කටයුතු සිදු කිරීම. ජාතික රූපවාහිනී මගින් අනුරාධපුර ජන කෞතුකාගාරය පිළිබද රූපවාහිනී පටිගත කිරීම් සිදු කරන ලදී. කෞතුකාගාර උද්‍යානය හා ඖෂධ උයන සැකසීම සිදු කරන ලදී.

### (8) ගාල්ල ජාතික කෞතුකාගාරය.

පාසැල් හා විශ්ව විද්‍යාල සිසුන් සඳහා දේශන පැවැත්වීමත්, පාසැල් සිසුන්ගේ ව්‍යාපෘති සඳහා තොරතුරු ලබාදීමත්, සම්මන්ත්‍රණ හා වැඩමුළු ද පවත්වා ඇත. කෞතුකාගාර ගොඩනැගිල්ල අභ්‍යන්තර හා පිටත තීන්ත ආලේප කිරීම, ආලින්දයේ විදුලි ලාම්පු සවිකිරීම, ප්‍රධාන නාම පුවරුව අලුතින් සවි කිරීම, කෞතුකාගාර ප්‍රදර්ශන ප්‍රතිසංවිධානය සහ කෞතුකාගාර අභ්‍යන්තරයේ හා කෞතුකාගාර ප්‍රදර්ශනයන් සඳහා විදුලි ආලෝකකරණය සිදු කරන ලදී. ගාල්ල ජාතික කෞතුකාගාරයේදී 2013 සැප්තැම්බර් 10 වන දින ශ්‍රී ලංකා - චීන ඓතිහාසික සම්බන්ධතා මැදිරිය විවෘත කරන ලදී.





**2013/09/10 වන දින ශ්‍රී ලංකා - චීන ඓතිහාසික සම්බන්ධතා මැදිරිය විවෘත කිරීම.**

## (9) නිදහස් අනුස්මරණ කෞතුකාගාරය.

නිදහස් අනුස්මරණ කෞතුකාගාරය මගින් පාසැල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන්ගේ ව්‍යාපෘති, සහ පර්යේෂකයින් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම, දේශන පැවැත්වීම  සිදු කරන ලදී. අද පුවත්පතට කෞතුකාගාරය පිළිබඳ තොරතුරු ලබා දෙන ලදී. ගැම්ගෙයි යම් යම් නවීකරණ කටයුතු සිදු කිරීම. ස්වාධීන රූපවාහිනී ආයතනය මගින් 2013 නිදහස් දිනය නිමිත්තෙන්ද, රූපවාහිනී ආයතනය මගින් 2013 ටොරින්ටන් රූපවාහිනී වැඩසටහන සහ සිරිස Kids 1st විශේෂ වාර්තා වැඩ සටහන සඳහා සිරස ආයතනය මගින් නිදහස් අනුස්මරණ කෞතුකාගාරය පිළිබඳ රූපවාහිනී පටිගත කිරීම් සිදු කරන ලදී. කෞතුකාගාරයේ වායු සමීකරණ පද්ධතියේ  අලුත් වැඩියා කටයුතු මෙම වසරේදී සිදු කර ඇත.

(ඔ) 2013 වසරේ ආදායම

| කෞතුකාගාරයේ නම | ප්‍රවේශපත්‍ර | ප්‍රකාශන | කැමරා බලපත්‍ර | ගොඩනැගිලි කුලිය | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| කොළඹ ජාතික කෞතුකාගාරය | 12917500.00 | - | 1437000.00 | 386375.00 | 100930.00 | 14841805.00 |
| ජාතික ස්වභාවික විද්‍යා කෞතුකාගාරය | 1170190.00 | 661.00 | 53250.00 | - | 132270.00 | 1356371.00 |
| කෞතුකාගාර පුස්තකාලය | - | - | - | - | 205226.00 | 205226.00 |
| ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරය | - | - | - | - | 346000.00 | 346000.00 |
| අධ්‍යාපන හා ප්‍රකාශන අංශය | - | 631123.30 | - | - | - | 631123.30 |
| ඕලන්ද කෞතුකාගාරය | 460825.00 | 5524.00 | 27000.00 | - | - | 493349.00 |
| මහනුවර ජාතික කෞතුකාගාරය | 1870920.00 | 45782.50 | 95750.00 | - | - | 2012452.50 |
| ගාල්ල ජාතික කෞතුකාගාරය | 1100915.00 | 59539.00 | 51500.00 | - | 12380.00 | 1224334.00 |
| රත්නපුර ජාතික කෞතුකාගාරය | 168160.00 | 61286.00 | 15750.00 | - | - | 245196.00 |
| ගාල්ල සමුද්‍ර කෞතුකාගාරය | 1241510.00 | 800.00 | 56000.00 | - | - | 1298310.00 |
| ජන කෞතුකාගාරය අනුරාධපුර | 90105.00 | 21586.50 | 2000.00 | - | - | 113691.50 |
| නිදහස් අනුස්මරණ කෞතුකාගාරය | 360935.00 | 1062.00 | 5500.00 | - | - | 367497.00 |
| එකතුව | 19381060.00 | 827364.30 | 1761750.00 | 386375.00 | 796806.00 | 23153355.30 |

2013 වසරේ ආදායම 2012 වසරේ ආදායම සමග සංසන්දනය කිරීම.

| වර්ෂය | ප්‍රවේශපත්‍ර | ප්‍රකාශන | කැමරා බලපත්‍ර | ගොඩනැගිලි කුළිය | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 2013 | 19381060.00 | 827364.30 | 1761750.00 | 386375.00 | 796806.00 | 23153355.30 |
| 2012 | 22877015.00 | 858229.00 | 1386450.00 | - | 733522.00 | 25855216.00 |

2012 වර්ෂයේ ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මුළු ආදායම රු. 25855216.00 ක් වන අතර, 2013 වර්ෂයේ සමස්ත ආදායම රු:23153355.30 ක් පමණ වේ.

සනුජා කස්තුරිආරච්චි.

ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ (වැ.බ)

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

කොළඹ- 07.

❖ ඇමුණුම - 01

1. ලේඛන සමීක්ෂා නව ආලෝක ධාරා
2. ගිරා සංදේශය අරුත් පහදු විවරණය
3. දක්ෂිණ අනුරාධපුරයේ වෙස්සගිරිය
4. නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශය තුළ තක්සේරුව හා ඇගැයීම
5. බෞද්ධ සෞන්දර්යවාදය සහ රසවින්දනය
6. ජීවිතයේ අවසන් අත්දැකීම
7. ගන්ධබ්බය
8. සිරි සම්බුදු අසිරිය සහ බුදු දහමේ තතු විමසුම
9. විශ්වය පුරා විහිද ගිය අභිරහස්
10. ආපදා සන්නිවේදනය න්‍යාය හා ව්‍යවහාරය
11. සාපරාධී යුද්ධ සංග්‍රම
12. ශ්‍රී ලාංකේය සමාජය සමාජ විද්‍යාත්මක පැතිකඩක්
13. පරිගණක තෝරා ගැනීම හා පරිශීලනය
14. මහින්දාගමනයෙන් අප ලද සංස්කෘතික දායාද
15. Steps to Mastery of English Grammer
16. උතුම් ත්‍යාගය
17. The Role of Bhikkhus in Sri Lanka
18. ශ්‍රී ලාංකේය සංස්කෘතියේ වෙළඳ කලාප ලකුණ
19. ශ්‍රී ලංකාවේ ලන්දේසි බලකොටු
20. අතීත උරුමයක සොඳුරු මතක සටහන්
21. මා දුටු දඹදිව
22. මූර්තියෙන් මූර්තිමත් බුද්ධ
23. අත් අකුරු හෝඩිය නොහොත් ලියන සැහැල්ල
24. මනෝව්‍යාධීන්ගෙන් මිදීමේ මග
25. බෞද්ධ ඥාන විභාගවාද ප්‍රවේශය
26. විමුක්ති ගතික කිතුණු ඇසින්
27. උරුමය සොයා යන ආනන්දීයයන්
28. විශ්ව සාහිත්‍ය සේවනය
29. අරමුණු ඇත්තෝ ලොව ජය ගත්තෝ
30. Ceylon along the Rail Track
31. ලක්දිව එක්සේසත් කිරීම
32. කොළොම්පුර පුරාවෘත්තය
33. සුණු විසුණු කල අභියෝග
34. Role Model Servies
35. උත්තර භාරතීය සංගීතය සහ ශාස්ත්‍රීය ගායන ශෛලී
36. නවමඟක සංකථන
37. සිනමාව මාධ්‍ය හා කලාව
38. සංඛ්‍යාන අනුමිතිය,න්‍යාය සහ භාවිතය
39. හෙළ කිතුනු වැලපුම් ගීත සාහිත්‍ය
40. Sri Lankan Folk Tales for Suren & Amrit
41. සදාචාර පුෂ්පය

42. සිංහල සාහිත්‍ය විමසුම
43. Civil Service Administration in Ceylon
44. උල්කාෂ්මියෙන් පැමිණි විකෘති ජීවියෝ
45. සමබර දිවි පෙවෙත හා වැඩ ලෝකය ජය ගැනීම
46. දැනගෙන පිදිය යුතු කඨින චීවරය
47. නිහඬ මෙහෙවර
48. ගෘහ සැලසුම් හා ප්‍රත්‍යක්ෂ වාස්තු
49. පශ්චාත් නූතනවාදී විචාර ව්‍යුහය
50. කුලී කවියෙකුගේ පාපොච්චාරණය
51. විද්‍යාත්මක හස්ත ජ්‍යෝතිෂ විද්‍යාව
52. ජපන් බසට සරල මගක්
53. තුන්වන ධර්ම සංගායනාවේ ඇතුළත කතාව
54. ප්‍රාග්ධනයේ පිරිවැය හා ප්‍රාග්ධන අයවැයකරණය
55. වනාන්තර සුරැකුමට වන විද්‍යා පර්යේෂණ
56. බුද්ධියේ හිරු කිරණ
57. ඵලදායිතා වර්ධනය සඳහා තත්ත්ව කව සංකල්පය
58. රණවිරු පුනරාගමනය
59. ජෝන් ද සිල්වා කවියාණෝ
60. අනුරාධපුර සෙල්ලිපි වලින් හෙළි වන සංග සමාජය
61. සසරක රහස
62. කවදා නම් අපි නිදහස් වෙමුද
63. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම විකාශනය
64. සමුපකාරය ප්‍රජා සංවර්ධනය හා කාන්තා සහභාගිත්වය
65. අප අවට වායුගෝලය
66. තිරසර සංවර්ධනය සහ කාන්තාව
67. පූර්ව භාෂා කුසලතා වර්ධනය කිරීම
68. Medicine at Large
69. ඉංග්‍රීසි භාෂාවේ නිපාත පද භාවිතය
70. ළමා මානසික ගැටලු
71. ජීවිතයට ආලෝකයක්
72. පාඨශාලීය සිංහල දෙමළ ශබ්ද කෝෂය
73. මෝටර් රථ ප්‍රවාහන පනත හා මෝටර් රථ ප්‍රවාහන නියෝග
74. මල් වගාව හා උද්‍යාන අලංකරණය
75. හදවත් රෝග පිළිබඳව දැනුවත් වන්න
76. මානව සම්පත් කළමණාකරණය න්‍යාය සහ භාවිතය
77. Business &Coporate Affairs
78. ගැටලු විසඳීම සඳහා විද්‍යාත්මක ක්‍රමවේදයන්
79. අළෙවිකරණ සන්නිවේදනය
80. ඕස්ට්‍රේලියානු ගවේශණ
81. සැඟව ගිය අපේ සටන් කලාව
82. පන්සාලිස් වසක මතක සටහන්
83. අසිරිමත් දෙතිස් මහා පුරුෂ ලක්ෂණ
84. ශ්‍රී ලාංකේය ඡායාරූප වංශය

85. භෛරව පූජාව හා උපත
86. ග්‍රාමීය සංවර්ධනය සඳහා විකල්ප ප්‍රවේශයන් හා ක්‍රමෝපායන්
87. මහානාගකුල සන්දේශය
88. ප්‍රඥා සාහිතයේ ජෝබ් විවරණය සහ දෙවි මිනිස් සබඳතාව
89. සත්ත්ව ලෝකයේ ජෛව විවිධත්වය
90. තිස්පස් වසරක විචාර භූමිකාව
91. සාහිත්‍ය කලා ප්‍රදීපිකා
92. දෙවැනි ගජබා නිරිඳුන්ගේ කන්තලේ රාජධානිය
93. ජාතියේ විමුක්ති අරගලය
94. සාපේක්ෂතාවාදය සරල බසින්
95. ජාතියේ පියා හෙවත් අනගාරික ධර්මපාල
96. සඵලවත් ගුරුවරයෙකු විය හැකි මග
97. යොවුන්වියේ පෞරුෂය ශක්තිමත් කර ගත හැකි මග
98. කොළොම්තොට පුරාණය
99. සාධුචර්යාව නම් වූ බ්‍රහ්ම විහාර
100. ශාක ලෝකය, සත්ත්ව තොරතුරු,නව සොයා ගැනීම්
101. ලෝක විනාශය කෙසේ සිදු වේද
102. දෙමළ හත්පත්තුව නම් වූ හත්පත්තුවේ රට
103. උසස් පෙළට තොරතුරු තාක්ෂණය (GIT)
104. ආයුර්වේද මතානුකූල ෂඩ්චක්‍ර නිරූපණ සංග්‍රහය
105. පුරාතන නාඩගම් අද්‍යතන ස්වරූපය
106. පාසල හා ළමා විනය බිඳවැටීම
107. සුදු වෙස් මුහුණ සහ වෙනත් කවි
108. පුරාණ රහස් ක්‍රම සහිත පවුලේ අත් වෙද පොත
109. පැරණි ආරක්ෂා මහා මන්ත්‍ර
110. තොටගමුවේ රාජමහා විහාරය හා රාහුල සංඝරාජ හිමි
111. රූපවාහිනිය සහ සන්නිවේදනය
112. සිංහල වියරණ විදි
113. පුරාතණ සන්න සහිත මහ පිරිත් පොත
114. ආහාර හා පෝෂණය
115. විඳු ඇසට යොමු කළ පුනර්භව ගමන් මඟ
116. ශ්‍රී ලාංකේය ප්‍රතිමාකරණ සම්ප්‍රදායය
117. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
118. ශ්‍රී ලංකාවේ පැරණි කාසි
119. ශ්‍රී ලංකාවේ පැරණි දේශීය අධ්‍යාපනයේ විෂය මාලාව
120. අධ්‍යාපන පරමාර්ථ හා ප්‍රතිපත්ති
121. අධි මානසික විද්‍යාවේ ප්‍රායෝගික රහස් සමඟ බලය ලබා ගැනීමට මග
122. යුගයක පිය සටහන්
123. සංඥාලෝකයෙන් විහිදෙන රහස්
124. ජීවක රතරෝග චිකිත්සා සංග්‍රහය
125. කය ගැන සොයන මග
126. භාවනාව තුළින් දරුණු රෝග වළක්වා ගනිමු
127. නිර්මාංශ ආහාර තුළින් දරුණු රෝග වලක්වා ගනිමු

128.  විශේෂ සාපේක්ෂතාවාදය යනු කුමක්ද
129.  උසස් තරංග විභාග අභියෝග්‍යතාව හා බුද්ධි පරීක්ෂණය
130.  පියෙකුගෙන් ඔහුගේ දුවට යැවුණු ලිපි
131. සිංහල කෙටිකතාවේ විකාශනය අෂ්ටම භාගය
132.  ජීවිතය හැඩවෙන්න තිරුක්කුරල් කියවන්න
133.  අනුරාධපුර යුගයේ භික්ෂු විනය
134. එංගලන්ත ඉතිහාසය -1කාණ්ඩය
135. ජාතක කථා හා නාට්‍ය මූලධර්ම
136. භාෂා අධ්‍යනය හා සිංහල ව්‍යවහාරය
137. කොහොඹා යක් කංකාරිය සහ සමාජය
138. ශාසන ඉතිහාසය හා බෞද්ධ සංස්කෘතිය
139. දත්ත සැකසීම කළමණාකරණ තොරතුරු පද්ධති සහ තාක්ෂණය
140. අනතුරු වලින් ඔබේ දරුවා රැකගන්න
141. සපරගමුවේ මහා සමන් දෙවොල
142. කොණ්ඩදෙණියේ හාමුදුරුවන්ගේ විස්කම්
143. Guide to Tipitaka
144. කර්ණාටක සංගීත ප්‍රවේශය
145. පරිසර පද්ධති විවිධත්වය
146. පුරාතන සන්න සහිත මහ පිරිත් පොත
147. ප්‍රෙතවස්තු වර්ණනාව හෙවත් ප්‍රෙත වස්තුසිංහල ප්‍රකරණය
148. සමීප රූප : රූපවාහිනී නාට්‍ය කලාව
149. සංසාර මන්දිර නොහොත් ඇමරිකානු දිවැසින් දුටු කර්මය හා පුනර්භවය
150. අති පූජ්‍ය වැලිවිට සරණංකර හිමි
151. බෞද්ධ ප්‍රබෝධයට මුල පිරූ හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා
152. සංකාර්ය කළමණාකරණය
153. මාර්ටින් වික්‍රමසිංහ පුවත්පත් කලා මෙහෙවර
154. ශ්‍රී ලංකාවේ ආක්‍රමණශීලී ශාක
155. චීන බෞද්ධ ඉතිහාසය හා සම්ප්‍රදාය
156. උඩරට බෙහෙත්ගෙයි අත් වෙද පොත
157. ශ්‍රී ලංකාවේ පැරණි රාජ්‍ය පරිපාලන රටාව
158. සාර්ථක ගිහි ජීවිතයක් සඳහා වන බෞද්ධ ප්‍රතිපදාව
159. විභාගෙට යන පුතුට ඔවදන්
160. හෙළ බසින් නැණ ලොවට
161. චිත්ත බලය සහ ගුප්ත ශාස්ත්‍ර
162. ඉගෙනුම් කාර්යක්ෂමතා වර්ධනය
163. ආරම්භයේ සිට දඹදෙණි යුගයේ අවසානය තෙක් චිරන්තන සිංහල ගද්‍ය සාහිත්‍ය ඉතිහාසය
164. ආහාර පෝෂණය හා ආරක්ෂාව
165. මුදල් රෙගුලාසි හා රාජ්‍ය සේවකයා
166. දීප්තිමත් නායකයෙකු වීමට බාලදක්ෂ නායකත්වය
167. පාළි ව්‍යාකරණ මාලාව - 1
168. ලක්බිම භූ පරම්පරා හා ප්‍රධාන භූ නිධි
169. ධීවර ආම්පන්න තාක්ෂණය සහ මසුන් ඇල්ලීමේ ක්‍රම
170. ජාතක කතා හා සිංහල නාටකය

171. සමාජීය මානවීය විද්‍යා පර්යේෂණ,දාර්ශනික සහ ක්‍රමවේදී හැඳින්වීමක්
172. Devils in the Paradise Island
173. දාඕ දර්ශනය හා ආගමික සම්ප්‍රදාය
174. Organizational Behavior
175. සිංහලෙන් හා ඉංග්‍රීසියෙන් ඉතාලි භාෂාව
176. බෞද්ධයා නොමග යවන මිථ්‍යා මතවාද සහ ක්‍රියාකාරකම්
177. සිංහල කවිය සහ කොළඹ කවි පරපුර
178. Economic Importance of Tropical Plants
179. ජාත්‍යන්තර ව්‍යාපාර කළමණාකරණය
180. ජාතික සංවර්ධනය හා ලාංකේය ගුවන්විදුලිය
181. තත්කාල ශාස්ත්‍රයෙන් ඔබට යහපත
182. Real Users in Virtual Worlds
183. අනුරාධපුර යුගයේ සමාජ ක්‍රමය
184. The Complete Illustrated History Sri Lanka
185. The Parliament of Sri Lanka
186. උතුරු ඇමරිකාවේ ථෙරවාද බුදු දහමේ ඉතිහාසය සහ සිංහල විහාර වංශය
187. සාර්ක් සංවිධානය හා ජාත්‍යන්තර සංවිධාන
188. සිරිලක දළදා මාළිගා
189. වාස්තු විද්‍යා අත්පොත
190. රාසිං දෙවියෝ 1 වන රාජසිංහ රජතුමා
191. ශ්‍රී ලංකාවේ සාක්ෂ්‍ය නීතිය 2 කාණ්ඩය
192. පුරාණ පහළ දොළොස්පත්තුවේ ජන සමාජය පිළිබඳ වගතුග
193. සාහිත්‍ය විචාර සංහිතා
194. වායු දූෂණය හා අම්ල වැසි
195. බුදුදහම බුද්ධිමතුන්ගේ ඇසින්
196. බෞද්ධ ශිෂ්ටාචාරය : මූලධර්ම හා වංශකථාව
197. සන්න සහ ගුත්තිල කාව්‍ය
198. පුනර්භවය හා නිර්වාණය
199. කර්ණාටක සංගීත ප්‍රවේශය
200. ශ්‍රී ලාංකේය විශ්‍රාම වැටුප්

ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය

தேசிய மரபுரிமைகள் அமைச்சு

**Ministry of National Heritage**